


©

# මතකයෙන් මැකී යන රැදවියෝ

## ශ්‍රී ලංකාවේ ත්‍රස්ත විරෝධී නීති උපයෝගි කර ගනිමින් දහස් ගණනක් අත් අඩංගුවට

AMNESTY INTERNATIONAL



© IRIN පුවත් සේවය

අතුරුදහන් වුවන් හා රැඳවියන් ගේ පවුල් වල සාමාජිකයින් විසින් 2009 සැප්තැම්බර් මස 9 දින කොළඹ දී පවත්වන ලද විරෝධතාවයේ දි මවක් සිහිසුන් ව බිම වැටී සිටි අයුරු. ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ අතිවිශාල සංඛ්‍යාවක් රඳවා තබා ගෙන සිටින අතර, ඔවුහු රඳවා තිබෙන ස්ථාන නිතර මාරු කිරීම නිසා පවුල් වල සාමාජිකයින් ට රැඳවියන් රඳවා සිටින ස්ථාන සොයා ගැනීම අතිශය දුෂ්කර වී තිබේ.
කවරය : හමුදා භටයෙක් විසින් මාර්ග බාධකයක් අසල දි වාහනයක් නතර කිරීමට අණ කරයි. ආණ්ඩුව හදිසි නීතිය ලිහිල් කිරීමට යෝජනා කළත් එහි බොහෝ වගන්ති තවමත් ක්‍රියාත්මකව පවතී. (2010 මැයි කොළඹ ශ්‍රී ලංකාව). © ඡයාරූපය: AP පුවත් සේවය / එරංග ජයවර්ධන

'අනෙක් අය නින්දට ගොස් සිහින දකිති. මම සෑම රැයක් ම නොනිදා පහන් කරමි. මීට තුන් වසරකට පෙර මගේ සැමියා අත් අඩංගුවට ගෙන කිසිදු චෝදනාකින් තොරව රඳවා තබා ගත් දින සිට මගේ ජීවිතයේ ආලෝකය නිවී ගියා සේය.'

සෙල්වි- 2007 පෙබරවාරි සිට ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ අත් අඩංගුවේ පසුවන රැඳවියෙකු ගේ භාර්යාව

ශ්‍රී ලංකාවේ මර්දනකාරි ත්‍රස්ත විරෝධී අණ පණත් යටතේ කිසි දු නඩු විභාගයකින් හෝ චෝදනාවකින් තොරව රඳවා ගෙන සිටින දහස් ගණනක් රැඳවියන් ගේ බලාපොරොත්තු ක්‍රමයෙන් බිඳ වැටෙමින් පවතී. ඇතැම් විට අබිරහස් රැඳවුම් කඳවුරු වල පවා රඳවා සිටින මෙම රැඳවියන් අත් අඩංගුවේ සිටිය දි ඝාතනයට හා වධ හිංසාවන් ට ගොදුරු විමට මෙන් ම විවිධාකාරයේ අවමන් සහගත සැලකිලි වලට භාජනය විමට තිබෙන ඉඩ කඩ අපමණය.

1971 ෂීඨ ශ්‍රී ලඞඛෘතඟ උඛණ්ඨනඹ ශදිෂී ණීතී තසෘගුලෘෂී බ්‍රීයෘත්ඹබ න එනතී. හලයඨ එත් නූ ෂැඹ උෘණ්ඩූනඛ් ඹ කෘතීබ උෘසෘකෂෘනඨ ඹූනෘ වී ඊතෘ වූඑල් එසෘෂයබ එැතීරි යණ ණීතී රිතී ශෘ තසෘගුලෘෂී ෂඍෟඹත තබෘඨ තගණ උැත්තෘශ.

තඍෟනඎෂ් ෂඹශසෘඛ් ඊතෘඹත් නසෘබූලා. තඍෟ ණීෂෘ ශ්‍රී ලඞඛීබ වූසෘනැෂීයණ් තග් හෘෂණතඡ් උඹීතීය, ශෘධ ෂෘක්ෂීයඨ ඔබඟන උධශෂ් ව්‍රබෘශ ඛීරිතඍෟ ණීධශෂ තඹණ් ඹ ණීතීයඨ එරිහෘශීසෘන උත්උඪඞගුනඨ ගැණීඹඨ ශෘ සෘඳනෘ තහෘ තණෘගැණීතඍෟ උඹීතීණ් ඊතෘ ව්‍රහල තලෂ තෂෘ්ද එෘඑනඨ ලඛ් වී තීතරී. තඹඹ උඹීතීණ් ශ්‍රී ලඞඛෘන ධ එෘර්ශනඛසෘැනඛු නණ උණ්තර් කෘතීබ ෂීවීල් ශෘ තඨ්ශඑෘලණ ව්‍රඥෘඒතීතඡ් ඊතෘඹත් එැශෑදිලීන ධඛ්නෘ තීතඍණ උඹීතීනෂීබඍෟ තනීී.

## හදිසි අවස්ථා රෙගුලාසි

හදිසි නීති රෙගුලාසිබ විසින් රාජ්‍ය බලධාරීන් ට පුද්ගලයින් අත් අඩංගුවට ගැනිමටත් අබිරහස් රැඳවුම් මධ්‍යස්ථානයන් හි රඳවා තබා ගැනිමටත්, අත් අඩංගුවේ සිටිය දි පුද්ගලයින් අතුරුදහන් කිරිමටත් කෲර වධහිංසා පැමිණ විමටත් හා මරා දැමිමටත් ඉතා පුළුල් බලතල ලබා දෙයි. මේ සියල්ල ම අන්තර් ජාතික නීතිය යටතේ අපරාධ ලෙස සැලකේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන වගන්තියෙන් හදිසි නීති රෙගුලාසි යටතේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙහි අඩංගු වගන්ති හැර වෙනත් ඕනෑම නීතියක් ජනාධිපතිවරයාට අත්හිට විමට පුළුවන.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන වගන්තිය විසින් 1947 බ්‍රිතාන්‍ය යටත් විජිත බලධාරීන් විසින් හඳුන්වා දෙන ලද මහජන ආරක්ෂක ආඥා පණත ශ්‍රී ලංකාවේ මූලික නීතියේ කොටසක් බවට පත් කොට ඇත. මහජන ආරක්ෂක පණතේ 5 වන කොටසට අනුව හදිසි රෙගුලාසි පැනවිම සම්බන්ධයෙන් වෙනත් කාරණා අතර විශේෂයෙන් ම:

- චෝදනාවකින් හෝ නඩු විභාගයකින් තොරව රඳවා තැබිමට බලය පැවරිම;
- ඕනෑම දේපලකට ඇතුල් විමට පරීක්ෂා කිරිමට හා අත්පත් කරගැනිමට බලය පැවරිම;
- ව්‍යවස්ථාව හැර අනෙක් ඕනෑම නීතියක් සංශෝධනය කිරිමට හෝ අත් හිටුවිම;
- නඩු විභාග පැවැත්විම පිණිස විශේෂ අධිකරණ පිහිටුවිම.

මීට අමතරව විධායකයට ඕනෑම රාජ්‍ය නිලධාරියෙක් විසින් සිදු කරන ලද රාජකාරි කටයුත්තක් සම්බන්ධයෙන් අපරාධ හෝ සිවිල් නඩු පැවරිමකින් වලක්වා ලිම ද කළ හැකිය.

## මනෝ

බදුල්ලෙහි පදිංචිකරුවකු වන මනෝ අත් අඩංගුවට ගෙන ආරක්ෂක අංශ විසින් නඩු විභාගයකින් තොරව රඳවා ගෙන සිටියි. 2007 මාර්තු මාසයේ දි සිය නිවස බලා යමින් සිටිය දි මනෝ ආරක්ෂක අංශ විසින් එල් ටි ටි ඊ සැකකරුවෙක් ලෙස සලකා අත් අඩංගුවට ගත්තේය. නමුත් මෙම චෝදනා මනෝ විසින් ප්‍රතික්ෂෙප කරන ලදි. කිසිදු ආකාරයක නීතිඥ සහායක් ඔහුට ලබා ගැනිමට නොහැකි වු අතර මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කිරිමට මාස අටක් ගත විය. අත් අඩංගුවේ සිටිය දි ඔහුට වධ හිංසා පමුනුවන ලද අතර දකුණු අතෙහි සුළැඟිල්ල බිඳින. ඔහු සිර ගෙවල් ගණනාවකට මාරු කරන ලද අතර අද වන විට ඔහු මඩකලපු බන්ධනාගාරයෙහි රඳවා සිටියි.'සියළු ම රැඳවියන් පොදුවේ රඳවා තිබේ.' ඔහු ප්‍රකාශ කරයි. 'බන්ධනාගාර නිලධාරීන් රිමාන්ඩ් සැකකරුවන් හා දඬුවම් ලැබුවන් එකිනෙකා ගෙන් වෙන් නොකරයි. අපට ප්‍රමාණවත් ආහාර නොලැබෙන අතර වැසිකිළි හා ජල පහසුකම් කොහෙත් ම ප්‍රමාණවත් නැත....බොහෝ සිරකරුවන් චර්ම රෝග වලින් පෙලෙත්.'

බොහෝ දේශපාලන සිරකරුවන් හට නීති ආධාර ලබා ගැනිම පිණිස ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොමැත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ ගැනෙන නඩු විභාග පිණිස පෙනී සිටිමට නීතිඥවරුන් ට එල්ල කරන ලද තර්ජන නිසා 'ත්‍රස්තවාදි සැකකරුවන්' ලෙස මෙම සැකකරුවන් ගේ නඩු සඳහා පෙනී සිටින නීතිඥවරුන් ගේ සංඛ්‍යාවේ අඩුවක් ද දක්නට ලැබේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ පැමිණිල්ලකින් හෝ නඩු විභාගයකින් තොරව රඳවා සිටින සිය ගණනක් තමාට මඩකලපු බන්ධනාගාරයේ දි මුණ ගැසු බව මනෝ විසින් හෙළිදරව් කරන ලදි.



© රොයිටර්ස්

## ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත

ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත තාවකාලික විධිවිධානයක් වශයෙන් . දි හඳුන්වා දුන් අතර එය 1981 දි පනතක් ලෙස සම්මත කරන ලද්දේය. මෙම පනත අත් අඩංගුවට ගත් තැනැත්තෙක් නඩු විභාගය අවසන් වන තුරු නිවරදිකරු වෙක් ලෙස සැලකිම වැනි යටතේ අපරාධ විධි විධාන මගින් පිළි ගෙන තිබු ඇතැම් අයිතීන් ඉවත් කෙරින. එමගින් ත්‍රස්තවාදය වැළැක්විමත් සාමය කඩවන අනෙකුත් ක්‍රියාවන් මර්දනය කිරිමත් අපේක්‍ෂා කළේය.

මෙම පණත යටතේ අනිතීයානුකුල කටයුතු සම්බන්ධයෙන් ඕනෑම තැනැත්තෙක් අත් අඩංගුවට ගැනිමටත් චෝදනා ගොනු කිරිමකින් හෝ නඩු විභාගයකින් තොරව පොලිස් පරික්‍ෂණ නිම වනර තෙක් මාස 18 ක් ඔවුහු රඳවා තබා ගැනිමටත් පොලිසියට බලය ලැබේ. තවද මෙම පණත යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ පැවැත්වෙන නඩු විභාගයක සැකකරුවන් කාල වකවානුවක් නොමැතිව සිය අත්අඩංගුවේ තබා ගැනිමට ද පොලිසියට බලය ලැබේ. ශ්‍රී ලංකාව වැනි අධිකරණ පද්ධතියේ දූති රෝද සෙමින් භ්‍රමණය වන රටක සැකකරුවෙකුට නඩු විභාගයකින් තොරව දිර්ඝ කාලයක් අත් අඩංගුවේ පසුවිමට සිදු වේ.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත නිසා හමුදවන් ට සැලසුම් සහගතව මානව අයිතීන් උල්ලංඝණයට ඉඩකඩ සැලසින. හදිසි අවස්ථා රෙගුලාසි මෙන් ම ඉහත කි පණතේ වගන්ති යටතේ ත් ඉහළ ශ්‍රේණියක පොලිස් නිලධාරියෙකු ඉදිරියේ සැකකරුවෙකු විසින් කරණු ලබන පාපෝච්චාරණය අධිකරණයේ දි සාක්‍ෂියක් වශයෙන් පිළි ගනී. මේ නිසා සාක්‍ෂි වශයෙන් සැකකරුවන් ගෙන් පාපෝච්චාරණ ලබා ගැනිමට පොලිස් නිලධාරින් පොළඹවනු ලැබුවා පමණක් නොව පාපෝච්චාරණ ලබා ගැනිම පිණිස අහිංසක තැනැත්තන් දැඩි ලෙස වධ බන්ධයන්ට ලක් කිරිමේ ප්‍රවණතාවයක් ද බිහි විය. අවසානයේ දි එම පාපෝච්චාරණ මත පදනම් වු චෝදනා අභියෝග කිරිමේ බර ද පැටවුනේ සැකකරුවන් මතමය.

රඳවා ගෙන සිටින තැනැත්තන් ගෙන් බහුතරයක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ අත් අඩංගුවේ වසර ගණනාවක් සිටිය තැනැත්තන් ය. අත් අඩංගුවේ සිටිය දි මෙම සැකකරුවන් තැනින් තැනට මාරු කළ අතර නිල නොවන එසේත් නැත්නම් අබිරහස් ස්ථානයන් හි රඳවා ගෙන ප්‍රශ්න කරනු ලැබුහ. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය රැඳවියන් ගේ පවුල් ගණනාවක් සමග සාකච්ඡා කළ අතර ඔවුහු සියළු දෙනාම පාහේ සිය පවුලේ සාමාජිකයා හෝ සාමාජිකාව එක්කෝ පුනරුත්ථාපන කඳවුරකට හෝ වෙනත් රහස්‍ය රැඳවුම් මධ්‍යස්ථානයකට මාරු කිරිම නිසා ඔවුන් ආගිය අතක් සොයා ගැනිමේ දැඩි දුෂ්කරතාවයකට තමන් මුහුණ දෙන ප්‍රකාශ කළෝය.

'අපි අඳුරේ අතර මංව සිටිමු' ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට එක් රැඳවියෙකු ගේ මවක් කියා සිටියාය.

ඇතැම් අවස්ථාවන් හි යම් සැකකරුවෙක් මෙම ක්‍රමය තුළ යලි සොයා ගැනිමට නොහැකි වන පරිදි අතුරුදහන් විය හැකිය. මෙම තත්වය 2006 ජුලි මාසයේ දි ජනාධිපති ආඥාවක් මගින් කළ නියමය වන 'අත් අඩංගුවට ගනු ලබන සියළුම තැනැත්තන් පිළිබඳ විස්තර පැය 48 ක කාලයක් තුළ මානව හිමිකම් කොමිෂන් සභාවට වාර්තා කළ යුතු බවත් අත් අඩංගුවට ගනු ලැබු තැනැත්තන් ගේ පවුල් වල සාමාජිකයින්ට එමගින් අවශ්‍ය විස්තර ලබා ගත හැක' උල්ලංඝණය කෙරිණ.

**සුළු ජාතික දෙමළ ද්‍රවිඩයන් කොළඹ ප්‍රදේශයේ පොලිස් ස්ථානයක ලියා පදිංචි විම පිණිස පෙළ ගැසි සිටින අයුරු: (2008 සැප්තැම්බර් 21 දින) දිවයිනේ යුද්ධ කලාපයෙන් පැන ගිය බහුතරයක් ද්‍රවිඩ ශ්‍රී ලංකිකයින්, තමන් නැවත පදිංචි ස්ථානයට ආසන්නතම පොලිසියේ ලියා පදිංචි විය යුතුය. පොලිසිය මෙම නියෝගය හඳුන්වන්නේ එල් ටි ටි ඊ සංවිධානය බිඳ දැමිම පිණිස අත්‍යවශ්‍ය පියවරක් වශයෙනි.**



© ශ්‍රීරංගාමිශසී

## ද්‍රවිඩ නම් අත් අඩංගුවට ගැනීම

විශේෂයෙන් ම උතුරු,නැගෙනහිර පළාත් වල මෙන් ම කොළඹ හා තදාසන්න ප්‍රදේශයන් හි දි ද්‍රවිඩ ජාතික පුරවැසියන් බොහෝ විට සිය හෘද සාක්ෂියට එකඟව ක්‍රියාකිරිම නිසාම, 1983 සිට ස්වාධින රාජ්‍යයක් වෙනුවෙන් සටන් කරන ප්‍රධානම ආයුධ සන්නද්ධ කණ්ඩායම වන එල් ටි ටි ඊ සංවිධානයේ සැකකරුවන් වශයෙන් අත් අඩංගුවට ගනු ලබයි.

මෙම අත් අඩංගුවට ගැනිම් එක්කෝ හදිසි නිතී රෙගුලාසි යටතේ එසේත් නැත්නම් ත්‍රස්තවාදය වැළැක්විමේ පණත යටතේ සිදු කරනු ලබයි. මෙම තැනැත්තන් සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් අත් අඩංගුවේ තබා ගන්නා කාලයට අමතර රඳවා තබා  ගැනිම පිණිස රැඳවුම් නියෝග ලබා ගනු ලැබේ. අත් අඩංගුවට ගනු ලැබූ තැනැත්තෙක් පිළිබඳව ආසන්නතම පොලිසියේ ස්ථානාධිපතිවරයාට වාර්තා කළ යුතුය වැනි අත් අඩංගුවට ගනු ලබන තැනැත්තා ගේ ආරක්ෂාව පිණිස විධිවිධාන පනවා තිබුනත් ප්‍රායෝගිකව එය ක්‍රියාත්මක වන්නේ නැත.

තිස් පස් හැවිරිදි එලිල් දස වසරක් කිසිදු නඩු විභාගයකින් තොරව අත් අඩංගුවේ පසු වෙයි. ඔහු සැකපිට අත් අඩංගුවට ගන්නා ලද්දේ යාපනයෙහි සිය නිවසේ සිට වවුනියාව බලා ගමන් කරමින් සිටියදීය. අද වන විට ඔහු වැලිකඩ රිමාන්ඩ් බන්ධනාගාරයේ ත්‍රස්තවාදය වැළැක්විමේ පණත යටතේ රඳවා සිටියි. ඔහු ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය සමග සම්බන්ධවෙමින් කියා සිටියේ තමන් මෙන් අඩු තරමින් තව දස දෙනෙක් වත් අවුරුදු දහයකට අධික කාලයක් නඩු විභාගයකින් තොරව අත් අඩංගුවේ පසු වෙන බවයි. 'මෙම නඩු කවදා හෝ අවසන් වේයැයි මට කිසිදු බලාපොරොත්තුයක් නැත' ඔහු සඳහන් කරයි.

හදිසි නිතී රෙගුලාසි යටතේ මෙන් ම ත්‍රස්තවාදය වැළැක්විමේ පණත යටතේ නිතී විරෝධි කටයුත්තක නියුක්ත  ඕනෑම ස්ථානයකට ඇතුල් විමට, පරික්ෂා කිරිමට හා තැනැත්තන් අත් අඩංගුවට අසිමිත බලතල පොලිසිය වෙත පවරා දෙයි. උදාහරණයක් වශයෙන් පුවත්පත් කාර්යාල හා මුද්‍රණාල කිහිපයක් සීල් තැබිමට මෙම බලතල යොදා ගත් ආකාරය දැක්විය හැකිය.

ත්‍රස්තවාදය වැළැක්විමේ පණත යටතේ ආරක්ෂක කටයුතු පිළිබඳ ඇමතිවරයාට  අති විශේෂ බලතල ලැබෙන අතර, ඒ අනුව සැක කටයුතු පුද්ගලයෙකු තවදුරටත් පරික්ෂණ කටයුතු පිණිස රඳවා තබා ගැනිමට හෝ ආරක්ෂක පියවරක් වශයෙන් රඳවා තැබිමට නියෝග කළ හැකිය. අමාත්‍යවරයාට යම් කිසි තැනැත්තෙක් රඳවා තබා ගන්නා ස්ථානය සහ කොන්දේසි නියම කිරිමට පමණක් නොව අත් අඩංගුවට පත් තැනැත්තා ගේ මුලික අයිතිවාසිකම් වන යාමේ ඊමේ නිදහස, භාෂණයේ නිදහස, සමාගමයේ නිදහස සිමා කරමින් නියෝග පැනවිය කළ හැකිය.

මෙබඳු සිද්ධීන් සම්බන්ධයෙන් මාධ්‍යයට අවසරයකින් තොරව වාර්තා පළ කළ නොහැකිය. යම් කිසි තැනැත්තෙක් අත් අඩංගුවෙන් නිදහස් කළත් ඔහු ගේ යාමේ ඊමේ නිදහස, භාෂණයේ නිදහස හා සමාගමයේ නිදහස ආරක්ෂක අමාත්‍යාංශයට සීමා කළ හැකිය.

**කොළඹ වැලිකඩ බන්ධනාගාරයඃ ත්‍රස්තවාදය වැළැක්විමේ පණත යටතේ අත් අඩංගුවට ගනු ලබන්නන් බහුතරයක් රඳවා තබන්නේ මෙම බන්ධනාගාරයෙහිය. රැඳවියන් 1500 පමණ රඳවා තැබිම පිණිස ඉදි කරන ලද මෙම බන්ධනාගාරය අද එමෙන් තුන් ගුණයක් පමණ රඳවා තබන ස්ථානයක් බවට පත් ව ඇත.**



© ශ්‍රීයාංමණියා

## විසම්මුතිය නිහඬ කිරීම

ව්‍යවස්ථානුකූල නීතීන් හි සවභාවය හා නීතීමය ඌනතා නිවරදි කිරීම සම්බන්ධ කාරණා එසේ තිබිය දී, තවත් සලකා බැලිය යුතු කාරණයක් වන්නේ ආරක්‍ෂක හමුද විසින් තමන් වෙත හදිසි නීතීය යටතේ ලැබී ඇති අසීමිත බලතල ජනතාව බිය වැද්දීම පිණිස යොද ගන්නා ආකාරයයි.

ඊට හේතුව ඔවුහු ඉතා පුළුල් ලෙස අර්ථකථනය කළ ත්‍රස්තවාදය වැනි  ක්‍රියාවන් හදිසි නීතීය යටතේ මර්දනය කිරීමේ මුවාවෙන් මානව හිමිකම් ක්‍රියාධරයන්, ජන මාධ්‍යවේදීන්, වෘත්තීය සමිති නායකයින් ඇතුළු විසම්මුතිය වෙනුවෙන් පෙනී සිටින්නන් මර්දනය කිරීමයි.

'යුද්ධය අවසාන වූ නමුත් රජය හදිසි නීතී රෙගුලාසි අවලංගු කිරීමක් කරන බවක් නොපෙනේයැයි' නීතීවේදියෙකු වන සුදර්ශන ගුණවර්ධන ප්‍රකාශ කරයි. පැරණි ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත එලෙසම පවතින අතර ආණ්ඩුවලට මෙම නීතී මාධ්‍ය ඇතුළු වෙනත් විසම්මුතීන් මර්දනය කිරීමට මෙම නීතී යොද ගනී.

## යුක්තිය පමා කිරීම යනු යුක්තිය ප්‍රතික්ෂේප කිරීමයි

එල් ටි ටි ඊ සංවිධානය සමග යුද්ධය 2009 මැයි මාසයේ දි නිමා වූ නමුත් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව  තවමත් මාස් පතා හදිසි නීතීය දීර්ඝ කරයි. 2010 මැයි මස ආරම්භයේ දි ආණ්ඩුව මහජන රැස්වීම් පැවැත්වීම, ඇඳිරි නීතීය පැනවීම, ඇතැම් ප්‍රකාශන මුද්‍රණය කිරීම, නිවසට පැමිණෙන ආගන්තුකයින් ගේ නම් ආසන්න පොලිසියට වාර්තා කිරීම, සෝදිසි වරෙන්තුවකින් තොරව නිවාස හා දේපොළ පරීක්‍ෂා කිරීමට පොලිසියට තිබෙන බලය වැනි ඇතැම් හදිසි නීති රෙගුලාසි අහෝසි කරන බව ප්‍රකාශ කළේය. නමුත් රජය පසුව සිය ස්ථාවරය වෙනස් කරමින් දැනට කර ගෙන යනු ලබන ත්‍රස්ත විමර්ශන කටයුතු නිම වන තෙක් මෙම හදිසි නීතී කොන් දේසි ඉවත් කළ නොහැකි බව කියා සිටියේය.

තවද දේශිය හා අන්තර් ජාතික මානව හිමිකම් සංවිධාන නිරන්තරයෙන් ම ඉතා දරුණු නීතියක් වශයෙන් සලකන ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත අහෝසි කරන ලෙස ඉල්ලා සිටියත් රජය දිගින් දිගටම එම නීතිය පවත්වා ගෙන යයි.

බලධාරින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ තවදුරටත් පුද්ගලයින් අත් අඩංගුවට ගන්නා අතර ඔවුහු ඉතා අන්තනෝමතික ලෙස රඳවා තබා ගනු ද ලබයි. රජයේ නිල ප්‍රකාශයන් ට අනුව පුද්ගලයින් 1900 ආසන්න ප්‍රමාණයක් මේ වන විටත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ අළුතින් අත් අඩංගුවට ගෙන තිබේ.

කෙසේ වෙතත් එක් නීතිඥවරයෙක් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට කියා සිටියේ ' නීතිඥ වෘතිකයින් වන අප වත් තමන් නොකළ වරදකට සිරබත් සංඛ්‍යාව නොදන්නා බවයි. සමහර සැකකරුවන් අවසානයේ දි වරද පිළි ගන්නේ තමන් වරදක් කළ නිසාම නොව යුක්තිය පසඳලීමේ ක්‍රියාවලියේ රැහන් පටින් නිදහස් වීම පිණිසය. ඇතැම් සැකකරුවන් අවුරුදු දෙකක් හෝ තුනක කාලයක් කිසිදු නඩු විභාගයකින් තොරව බන්ධනාගාර ගත ව සිටිත්. බොහෝ අවස්ථාවලදී නඩු වලදී නඩු දින යන අතර මෙය සාධාරණ නඩු විභාගයක් පිණිස අප ගේ සේවාදයකින් ට ඇති අයිතිය උල්ලංඝණය කිරීමකි.'

අපරාධ පරීක්‍ෂණ නඩු ප්‍රමාදය රැඳවියන් ගේ ද කනස්සල්ලට හේතු වී තිබේ. 2010 ජනවාරි මස ද්‍රවිඩ දේශපාලන සිරකරුවන් දහස් ගණනක් එක්කෝ සාධාරණ නඩු විභාගයක් එසේ නැත්නම් නිදහස් කිරීමක් ඉල්ලා මාරාන්තික උපවාසයක් ආරම්භ කළෝය. මෙම උපවාසයට

**2010 ජනවාරි මස වැලිකඩ බන්ධනාගාරය ඉදිරිපිට දේශපාලන සිරකරුවන් නිදහස් කරන ලෙස ඉල්ලා ඔවුන් ගේ ඥාතීන් විසින් පවත්වන ලද උද්ඝෝෂණය.**





අනුරාධපුරය, මඩකලපුව, යාපනය, ත්‍රිමලය හා කොළඹ යන බන්ධනාගාර රැඳවියන් සහභාගි වූවෝය. මෙම උපවාසය ආරම්භ කොට දින අටකට පසු ජනාධිපතිවරයා සිරකරුවන් ගේ ඉල්ලීම් මාස දෙකක් ඇතුලත සලකා බලන බවට දුන් පොරොන්දුවක් මත එම උපවාසය අත් හිටුවන ලද නමුත් මේ වන තුරුත් සිරකරුවන් ගේ එම ඉල්ලීම් වලට සාධාරණයක් ඉෂ්ට නොවිය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ කරනු ලබන අත් අඩංගුවට ගැනීම් සියල්ලක් ම පාහේ අන්තනෝමතික ලෙස සිදු කරනු ලබන ඒවා වන අතර අපරාධ-යුක්ති විනිශ්චය ක්‍රියාවලිය තුල මෙම නඩු සම්බන්ධයෙන් සාධාරණ නඩු විභාගයක් අපේක්ෂා කළ නොහැකිය. රජයට ජාතික ආරක්ෂාව පිළිබඳ පියවරයන් ගැනිමට අයිතියක් තිබෙන අතර එමගින් පුරවැසියන් ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරිමක් අදහස් නොකෙරේ.

එක් නිතිඥවරයෙක් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට ප්‍රකාශ කළ පරිදි 'ශ්‍රී ලංකාවේ මර්දනකාරි හදිසි නිතීය දිර්ඝ කාලයක් ක්‍රියාත්මකව පැවති නිසා ආරක්ෂක හමුදවන් සිය කටයුතු සාමාන්‍ය අපරාධ නඩු විභාග ක්‍රියාවලියෙන් ඕබ්බෙහි පවත්වා ගෙන යන සම්ප්‍රදයක් ගොඩ නැගි තිබේ. අප ජිවත් වන්නේ ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් සිය දුරකථනය ඔසවා අසවලා ගේ කට වැඩියි ඌව අත් අඩංගුවට ගන්නැයි කී කළ එම නියෝගය එලෙසින්ම ක්‍රියාත්මක වන රටකය. සිවිල් ඇඳුමින් සැරසුන ආරක්ෂක නිලධාරින් 'ප්‍රශ්න කිරිම' පිණිස මිනිසුන් අත් අඩංගුවට ගෙන මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් නොකර රඳවා තබයි. සාමාන්‍යයෙන් කිසිවෙක් අත් අඩංගුවට ගැනිමට වරෙන්තුවක් අවශ්‍ය වන නමුත් හදිසි නිතීය යටතේ ආරක්ෂක හමුදවන්ට ඕනෑම තැනැත්තෙක් අත් අඩංගුවට ගැනිමට පුළුවන. රිමාන්ඩ් සිරකරුවන් ගෙන් බහුතරයක් කිසිදු නඩු විභාගයකින් තොරව දිර්ඝ කාලයක් අත් අඩංගුවේ සිටියි. මේ කාරණා අනුව ඔබට හදිසි නිතීයත් ත්‍රස්තාවාදය වැළැක්වීමේ පණතත් නිතීයේ ආධිපත්‍ය යටපත් කරන ආකාරය තේරුම් ගන්න පූළුවන් නේද?'

යම් කිසි පුද්ගලයෙක් අත් අඩංගුවට ගැනිමේ ක්‍රියා පටිපාටිය පිළිබඳ පැහැදිලි භාවයක් නොමැතිකම කනස්සල්ලට හේතුවකි. 2000 අප්‍රියෙල් මස බලහත්කාරයෙන් පැහැර ගෙන ගොස් අතුරුදහන් කිරිම් පිළිබඳ එක්සත් ජාතින් ගේ ක්‍රියාකාරි කමිටුව එක්කෝ හදිසි නිතීය හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් අහෝසි කරන ලෙස හෝ එසේ නැත්නම් එම නිතී ජාත්‍යයන්තර ප්‍රමිතීන් ට ගැලපෙන පරිදි සංශෝධනය කරන ලෙසට ලංකා රජයෙන් ඉල්ලා සිටින ලදි. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය ද අත් අඩංගුවට ගැනිම් සහ රඳවා තබා ගැනිම් පිළිබඳ රජයේ වගකිම් ජාත්‍යයන්තර මානව හිමිකම් නිතීයට අනුව විශේෂයෙන් ම සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥාප්තියට අනුව සිදු කරන මෙන් නැවත සිහිපත් කරමු.

## වෙට්ටිවෙල් හා වලමති ජාසිකරන්

**2008** මාර්තු **6** වන දින ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් ලේඛකයෙක්, ප්‍රකාශයෙක් සහ ශ්‍රී ලංකා අවුට්රිච් නැමති වෙබ් අඩවියේ කළමනාකරු වන වේට්ටිවෙල් ජාසිකරන් (ඉහළ *වම් ඡායාරූපය මංචු සහිතව **2008** මහේස්ත්‍රාත් අධිකරණය වෙත රැගෙන එන අයුරු)* ත්‍රස්තවාදි කටයුතු සම්බන්ධයෙන් සැක පිට අත් අඩංගුවට ගනු ලැබු අතර ඔහු ගේ බිරිඳ *(ඡායාරූපයේ දකුණු පසින්)* හදිසි නිතීය යටතේ රඳවා ගනු ලැබීය. **2008** ජුනි මාස **8** වන දින වේට්ටිවෙල් හා වලමතී ජාසිකරන් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරමින් තමන් අත් අඩංගුවට ගැනිම නිතී විරෝධී බවත් තමන් ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් කෲර වධ බන්ධනයන් ට ලක් කිරිම නිසා සිය මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වූ බවත් කියා සිටියේය. මේ අතර ආරක්ෂ ආමාත්‍යවරයා විසින් හදිසි නිතීය යටතේ ඔවුන් රඳවා තබා ගැනිම **2008** ජුනි මස **30** වනදු තෙක් දිර්ඝ කරන ලදි.

මාස හයකට පමණ පසු වෙට්ටිවෙල් ජාසිකරන් හට **2008** අගෝස්තු **27** දින 'වාර්ගික ගැටුම්' ඇවිස්සිම පිණිස නොර්ත් ඊස්ටන් මන්ත්ලි ප්‍රකාශනය මගින් අනුබල දෙන ලද්දේ යැයි නඩු පවරන ලදි. ඔහු ගේ බිරිඳ වලාමතීට සිය සැමියාට ආධාර අනුබල දිම සම්බන්ධයෙන් චෝදනා ගොනු කෙරින.

**2009** ඔක්තෝබර් **26** දින නඩු විභාගය ආරම්භ කොට වර්ෂයකට පසු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඔවුන් සියළු චෝදනා වලින් නිදොස් කොට නිදහස් කරන ලද්දේය.

## චන්දන සිරිමල්වත්ත



© ලංකා ඉරිදේශය



© ලංකා ඉරිදේශය

2010 ජනවාරි 29 දින පොලිස් අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් විසින් ලංකා ඉරිද පුවත් පත් කාර්යාලයට කඩා වැදී එම පුවත් පතෙහි ප්‍රධාන කර්තෘ චන්දන සිරිමල්වත්ත අත් අඩංගුවට ගත්තේය. ඔහු සන්තකයෙහි පැවති සංවේදී තොරතුරු අඩංගු ලිපි ගොනු පොලිස් නිලධාරීන් විසින් තමන් ට භාර දෙන ලෙසට චන්දන සිරිමල්වත්තට බල කළෝය. ලංකා ඉරිද පුවත්පත වාමාංශික දේශපාලන පක්ෂයක් වන ජනතා විමුක්ති පෙරමුණ ට සම්බන්ධ පුවත්පතක් වන අතර 2010 ජනාධිපතිවරණයේ දී සරත් ෆොන්සේකාට පක්ෂව මැතිවරණ ප්‍රචාරක කටයුතු වල නිරත වුයේය. මෙම පුවත් පත සාමාන්‍යයෙන් රාජපක්ෂ පවුල පිළිබඳ සාධාරණ විවේචන පළ කරන පුවත් පතක් වශයෙන් නමක් දිනා ගෙන තිබෙන පුවත්පතකි. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට වාර්තා වන අන්දමට පොලිසිය චන්දන සිරිමල්වත්ත ගේ නිවස ද පරීක්ෂා කිරීමට තැත් කළ අවස්ථාවේදී ඔහු ගේ බිරිඳ පොලිස් නිලධාරීන් වලංගු සෝදිසි වරෙන්තුවක් ඉදිරිපත් කිරීමට අසමත් වු බැවින් සිය නිවස පරීක්ෂා කිරීමට ඉඩ නොදීමට සමත් වුවාය. ජනවාරි 30 වන දින නැවත වරක් අපරාධ පරීක්ෂණ නිලධාරීන් ලංකා ඉරිද පුවත් පත් කාර්යාලයට කඩා පැන්න අතර එදින ඔවුහු එම කාර්යාලයට මුද්‍ර තබන ලදි. මෙම පරීක්ෂණ වලදී පොලිසිය ඉතාමත් නිර්දය ලෙස ලංකා ඉරිද මුද්‍රණාලයේ කාර්ය මන්ඩලයෙන් ප්‍රශ්න කළේය. මිට පෙර වතාවක දි එනම් 2009 සැප්තැම්බර් හා ඔක්තෝබර් මාස වල දි ද මෙම මුද්‍රණාලය සෝදිසි කරන තිබුනි.

චන්දන සිරිමල්වත්ත (ඡායාරූපයේ වම් පසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තු නිලධාරීන් විසින් ප්‍රශ්න කරන ආකාරය දකුණු පස ඡායාරූපය චන්දන සිරිමල්වත්ත නිදහස් කිරීමෙන් පසු) කොළඹ අධිකරණය විසින් 2010 පෙබරවාරි මස නිදහස් කිරීමට නියෝග කරන ලද නමුත් ඔහු බන්ධනාගාරයෙන් පිටතට පැමිණියේ 2010 මාර්තු මාසයේ දිය.

ඔහු නිදහස් කිරීමේ නියෝගය අධිකරණය විසින් සලකා බලන ලද්දේ ජන මාධ්‍ය විසින් චන්දන සිරිමල්වත්ත අත් අඩංගුවට ගැනිම පිළිබඳ පුළුල් ප්‍රචාරයක් කරන අතර තුර වාරයේ දි හා ජනාධිපතිවරයා විසින් ද අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවට ඔහු කඩිනමින් නිදහස් කිරීමට කටයුතු කරන මෙන් උපදේස් දුන් වාතාවරණයක් තුලය. අවසානයේ දි ඔහු නිදහස් කිරිම අගය කළ යුතු නමුත් මෙවැනි කාරණා සම්බන්ධයෙන් විධායකයේ මැදිහත් වන ආකාරය ද මෙහි දි මැනවින් නිරූපනය විය..

## ක්‍රියා කරන්න

**වහාම ක්‍රියාත්මක වන පරිදි ජනාධිපතිවරයා ආමන්ත්‍රණය කරමින්:**

■ නඩු විභාගයකින් තොරව අත් අඩංගුවේ සිටින සියළු දෙනාම නිදහස් කරන ලෙසත් සිවිල් හා අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය යටතේ ගැනෙන නඩු වහාම සිවිල් අධිකරණ මගින් විභාග කිරීමට කටයුතු යොදන ලෙසටත්;

■ හදිසි නීති රෙගුලාසි හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත වහාම අවලංගු කොට එකී අණ පනත් වල අඩංගු නීති රීති අන්තර් ජාතික මානව හිමිකම් නීතිය හා ප්‍රමිතීන් ට අනුකූලව ව්‍යවස්ථානුකූල නීතියට අන්තර් ග්‍රහණය කිරීම;

■ අත් අඩංගුවට ගනු ලබන තැනැත්තන් පිළිබඳ විස්තර හා රඳවා තබන ස්ථානය මානව හිමිකම් කොමිෂන් සභාවට දැනුම් දිය යුතු බවට 2006 ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද ආඥාවට අනුව කටයුතු කරන ලෙසටත් ඉල්ලා සිටින්න.

**ආයාචනය යවන්න:**

ඔබ ගේ ඉල්ලීම
අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා,
ජනාධිපති ලේකම් කාර්‍යාලය,
කොළඹ 1
ශ්‍රී ලංකාව

AMNESTY INTERNATIONAL

ඇම්නස්ටිඉන්ටර්නැෂනල් සංවිධානය බරපතළ මානව හිමිකම් කඩ විම් වැළැක්විම පිණිස ලොව පුරා රටවල් හා භූමි ප්‍රදේශ 150 ක ව්‍යාප්තව ඇති මිලියන 2.8 ආධාර කරුවන්, සාමාජිකයින් හා ක්‍රියාධරයන් සහිත ගෝලීය මානව හිමිකම් ව්‍යාපාරයකි.

මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය ඇතුළු අනෙකුත් මානව අයිතිවාසිකම් ප්‍රඥාප්තීන් හි අඩංගු අයිතීන් ලොව පුරා සැම තැනැත්තෙක් විසින් ම භුක්ති විදිනු දැකිම අප ගේ ප්‍රාර්ථනාවය.

අප ආණ්ඩු,දේශපාලන දෘෂ්ටීන්, ආර්ථික හෝ ආගමික උවමනාවන් ගෙන් නිදහස් අතර සිය සාමාජිකත්වයේ හා මහජනතාව විසින් සම්පාදනය කරනු ලබන අරමුදල් මත ක්‍රියාකාරී සංවිධානයකි.

සුචිය: ASA 37/001/2011
Sinhala

පෙබරවාරි 2011

Amnesty International
International Secretariat
Peter Benenson House
1 Easton Street
London WC1X 0DW
United Kingdom

amnesty.org